චක්‍රලේඛ අංකය : 1993 / 3

මගේ අංකය : අසේ/1/105
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
1993 මාර්තු මස 11 වැනි දින.

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාශ භාර නි. අ. අ. වරුන්

## විද්‍යාල සඳහා තීරුබදු රහිත වාහන මිලට ගැනීමට අවසර ලබා දීම

විද්‍යාලවලට ශිෂ්‍ය ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කිරීමට ආසන 15 ඇති වෑන් හෝ බස් රථ සුභ පතන්නන්ගේ පරිත්‍යාග මට්ටමෙන් තීරු බදු රහිත මිලට ලබා දීමට භාණ්ඩාගාර ලේකම් තීරණය කර ඇත.

තීරුබදු රහිත වාහන මිලට ගැනීමේ බලය තීරු බදු ආඥා පනතේ අංක 19ඒ අනුව ලබා දිය හැකි බවත්, එය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය යටතේ ඉල්ලුම් කළ යුතු බවත් දන්වා ඇත.

මේ පිළිබඳ ඔබ පළාතේ / කොට්ඨාසයේ ඇති විද්‍යාලවල වාහන අවශ්‍යතාව පිළිබඳ ඉල්ලුම් පත් ලබාගෙන ඔබගේ නිර්දේශය ද සහිතව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන්නට සලස්වන්න.

එහිදී,

1 විද්‍යාලය
2 වාහනය නඩත්තුව පිළිබඳ කෙටි වාර්තාවක්
3 විද්‍යාලයට වාහනයක් ලබා දීමට ඉදිරිපත් වන ආයතනයේ නම ආදි විස්තර සැපයිය යුතු වෙයි.

(ආර්. අයි. ටී. අලස්)
අධ්‍යාපන රාජ්‍ය ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ
අති / ලේකම්